268

# රැකියා සඳහා දෙමව්පියන් විදේශගතවීම දරුවන්ගේ අධ්‍යාපන (සාධන) මට්ටම් කෙරෙහි වන බලපෑම පිළිබඳ අධ්‍යයනයක්

පී.කේ. ආරියවතී

ECON/R/81/98

268

කැලණිය විශ්වවිද්‍යාලයේ සමාජයීය විද්‍යා පීඨයේ ආර්ථික විද්‍යාව පිළිබඳ සමාජයීය විද්‍යාපති පර්යේෂණ උපාධිය සඳහා ඉදිරිපත් කරන ලදී.

# <u>නිබන්ධ සාරාංශය.</u>

ශ්‍රී ලංකාව තුල විදේශ රැකියා සඳහා විගමනය වීමේ වැඩි ප්‍රවනතාවක් නූතනයේදී දකිය හැක.මෙම විදේශ රැකියා සඳහා යොමු වන පිරිස් වැඩි වශයෙන් විවාහකයින් වීම නිසා සමාජය තුළ නොයෙක් ගැටළු ඇතිවී ඇත. මෙම ඇතිවී ඇති ගැටළු අධ්‍යාපන ක්ෂෙත්‍රය තුළද දකිය හැක. සිසුන්ගේ සාධන මට්ටම් අඩු වීම අධ්‍යාපන ක්ෂෙත්‍රයේ ගැටළු අතරින් වඩා වැදගත් ගැටළුවක් බවට පත් වී ඇත.

දෙමව්පියන් විදේශ රැකියාවලට යොමුවීම නිසා පාසල් පද්ධතිය තුළ දරුවන්ගේ සාධන මට්ටම් කෙරෙහි බලපෑම් කිරීමට සමත්ව ඇද්ද? ඒ කවර ආකාරයෙන්ද? එසේ වීමට හේතු මොනවාද? යන්න සොයා බැලීමත් එසේ වී නම් එය විසදා ගැනීමට ගත හැකි විසඳීම් සොයාබැලීමත් මාගේ පර්යේෂණ නිබන්ධනයේ අරමුණු විය.

පර්යේෂණය සඳහා දෙමාපියන් විදේශ රැකියා වලට යොමු වූ ළමුන් 150 කගේ පවුල් අධ්‍යනයට ලක්විය. මෙම දරුවන් හා ඔවුන්ගේ පවුල් පිළිබඳව දෙන ලද ප්‍රශ්නාවලි මගින්ද, ළමුන් හා සම්මුඛ සාකච්ඡා කිරීමෙන්ද, මෙම දරුවන් හා සම්බන්ධ පාසල් වල ගුරුවරුන්, විදුහල්පතිවරුන්, හා ගුරු උපදේශක මහතුන් හා සකච්ඡා කිරීමෙන්ද තොරතුරු ලබා ගන්නා ලදී.

දරුවන්ගේ බුද්ධිමය හා කායික වර්ධනය අධ්‍යාපන කාර්යයේදී වඩා වැදගත් වේ.මෙම කාර්යය වඩා හොඳින් ඉටු කර දෙනුයේ මව විසිනි. එහෙත් මව විදේශ ගතවූ පවුල් වල දරුවන්ට එම කාර්යය මව අතින් ඉටු නොවේ.

එසේම දරුවන්ගේ වැඩි වගකීමක් පැවරී තිබුනේ පියා හට වුවත් එය නිසියාකාරව ඉටු නොවූ අතර ඔහු මත්පැනට යොමුවීමෙන් නිර්මාණය කරන ලද පරිසරය දරුවන්ගේ කාංසාමය තත්වයන් තීව්‍ර කරනලදී. දරුවන්ට මව නැති වීමෙන් ඇතිවූ මානසික පීඩනය තවත් පියා විසින් වැඩි කලද ඔවුන්ට තම ගැටළු විසදා ගැනීමට සිටි පුද්ගලයන් පිරිසද සීමා වූයේ මෙම පවුල් න්‍යෂ්ටික පවුල් වීම නිසාය.

මෙම දරුවන්ගේ පාසල් පැමිණීම දුර්වල වූ අතර ඉගෙනුම් ක්‍රියාවලියට අවශ්‍ය භෞතික ද්‍රව්‍ය සපයාගැනීමේදීද අඩුපාඩු ඇතිවීම නිසා ඉගෙනුම් ක්‍රියාවලියට ඔවුනට සක්‍රියව සහභාගීවීමට නොහැකි විය.

පාසල තුළ ක්‍රියාත්මක වන විෂය බාහිර ක්‍රියාකාරකම් වලදීද මෙම දරුවන් පසුබට වූ අතර ඔවුන් තුළ දකියහැකි වූයේ යහපත් ආකල්පමය වර්ධනයක් නොවේ.

මෙවන් තත්වයක් තුළ දරුවන්ගේ ඉගෙනුම් ක්‍රියාවලිය අඩපන වී අපේක්ෂිත සාධන මට්ටමට ළගාවීමට නොහැකි වී ඇත. එහෙත් පියා විදේශ රැකියා සඳහා යොමු

වූ පවුල්වල දරුවන් තුළ මෙම තත්ත්වය දකීමට නොහැකි වූයේ භාරකාරත්වය දරු මව තම වගකීම නිසියාකාරව ඉටු කළ නිසාය.

දෙමාපියන් විදේශ රැකියා සඳහා යොමු වූ දරුවන් කෙරෙහි ගුරුවරුන්ගේ අවධානය වැඩියෙන් යොමු කිරීම, විදේශ රැකියා සඳහා යොමු වන විවාහක කාන්තාවන්ගේ දරුවන්ගේ සුභසාධනය හා සුරක්ෂිතභාවය සඳහා ආයතනික අංශයන්ගේ අවධානයෙන් එම දරුවන්ට සුදුසු මධ්‍යස්ථාන පිහිටුවීම, විවාහක කාන්තාවන් විදේශ ගත වූ පසු ඔවුන්ගේ ස්වාමිපුරුෂයන් විවිධ විෂමාචාර ක්‍රියාවලට පෙළඹවීම වැළැක්වීමට විවිධ උපදේශන සේවා ආරම්භ කිරීම, දරුවන්ගේ මානසික ගැටළු වලට විසඳුම් ලබා දෙන මනෝ චිකිත්සක හා උපදේශන සේවා මධ්‍යස්ථාන පාසල් අශ්‍රිතව ආරම්භ කිරීම, විදේශගතවන්නන්ගේ දරුවන්ගේ වගකීම භාරගන්නා පුද්ගලයින් එම වගකීම නිසි ආකාරව ඉටු කිරීම,සමාජයේ සිටින ජ්‍යෙෂ්ඨ පුරවැසියන් විදේශ රැකියා සඳහා යොමු වූ පවුල් හා දරුවන් කෙරෙහි වඩාත් අවධානය යොමු කිරීම ආදී ක්‍රියාමාර්ග අනුගමනය කිරීම තුලින් දරුවන්ගේ සාධන මට්ටම යම් ආකාරයකට නගා සිටුවීමට හැකි වෙතැයි මගේ හැඟීමයි.